92121

OL/2021(2022)/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**43 | S | I**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)**
**General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)**


**චිත්‍ර I**
சித்திரம் I
Art I

*පැය එකයි*
*ஒரு மணித்தியாலம்*
*One hour*

* **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**විභාග අංකය** :......................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** දාරුමය කැටයම් පනේල නිර්මාණයන්ගෙන් හෙබි මෙම වාස්තු විද්‍යා නිර්මාණය .................................. නමින් හැඳින් වේ.

**2.** මෙම නිර්මාණය ..................................... යුගයේ දී තුන් වන වික්‍රමබාහු රජු විසින් ඉදිකරවන ලදී.

**3.** මෙහි නිර්මාණ ශිල්පියා වූයේ .......................................................... ය.

**4.** මෙහි කැටයම් වර්ගීකරණය කර ඇති තේමාවන්ට අනුව ‘දරුවාට කිරිපොවන මව’ නම් වූ කැටයම ....................................... වර්ගයට අයත් වේ.

**5.** මෙහි වහල නිර්මාණයේ දී යොදාගත්..................................... සුවිශේෂී වාස්තු විද්‍යා අංගයක් වේ.

[දෙවැනි පිටුව බලන්න.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** ලාක්ෂා වර්ණ භාවිත ක්‍රම දෙකකි. එකක් නියපොතු වැඩ වන අතර අනෙක් ක්‍රමය කුමක් ද?

..........................................................................................................

**7.** 'අප්පුහාමි' නම් වූ සුප්‍රකට කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියාගේ නම කුමක් ද?

..........................................................................................................

**8.** සිස්ටයින් දෙව්මැදුරේ දක්නට ලැබෙන ලොව විශාලතම ප්‍රෙස්කෝ සිතුවම කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................................................................

**9.** A.C.G.S. අමරසේකරයන්ගේ 'විරැකියාව' නම් වූ සිතුවම වඩාත් ප්‍රසිද්ධව ඇත්තේ කුමන නමකින් ද?

..........................................................................................................

**10.** ශ්‍රී ලාංකේය මූර්ති ශිල්පයට ලෝකඩ වාත්තු ක්‍රමය හඳුන්වා දුන් මූර්ති ශිල්පියාගේ නම කුමක් ද?

..........................................................................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට **යටින් ඉරක් අඳින්න**.

**11.** අනුරාධපුර රත්න ප්‍රාසාදයේ මුරගල හා සම්බන්ධ වන කොරවක්ගල නිර්මාණය වී ඇත්තේ,
(1) මකර මුවකින් විහිදී යන ගිනි සිලුවකිනි.
(2) සිංහ මුවින් විහිදී යන ඇත් සොඬකිනි.
(3) සිංහ මුවකින් විහිදී යන ගිනි සිලුවකිනි.
(4) මකර හිස හා සම්බන්ධ වූ ලියවැලකිනි.

**12.** සීගිරි චිත්‍ර, කලා විචාරකයින්ගේ ප්‍රසාදයට පත්ව ඇත්තේ,
(1) භාරතයේ අජන්තා චිත්‍රවලට සමාන නිසා ය.
(2) ශ්‍රී ලංකාවේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාවේ වැදගත් නිර්මාණයන් නිසාය.
(3) මේඝලතා හා විජ්ජුලතා නිර්මාණය කර ඇති නිසා ය.
(4) ප්‍රෙස්කෝ ශිල්ප ක්‍රමය අනුව චිත්‍ර ඇඳ ඇති නිසා ය.

**13.** පොළොන්නරුවේ පොත්ගුල් විහාර පිළිමයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
(1) කඩවසම් දේහධාරී ප්‍රතාපවත් මිනිසෙකු වේ.
(2) පොළොන්නරු යුගයේ පැවති මූර්ති ශිල්පයේ ප්‍රබුද්ධ කලා ලක්ෂණ වේ.
(3) පරාක්‍රමබාහු රජුගේ වාම් දිවි පෙවෙත වේ.
(4) පොළොන්නරු යුගයේ විසූ ඍෂිවරයෙකු වේ.

**14.** ඉන්දීය චිත්‍ර ශිල්පී රාජා රවිවර්මාගේ චිත්‍රවල දක්නට ලැබෙන දෘෂ්ටි මායා ප්‍රකාශන ශිල්ප ක්‍රමය අනුගමනය කළ ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියෙක් වන්නේ,
(1) තාවඩි එම්. තුරෛයිසාමි ය.
(2) පෙරියතම්බි සුබ්‍රමනියම් ය.
(3) කේ. කනගසභාපති ය.
(4) වී. ශිවඥානසුන්දරම් ය.

**15.** සාංචි තොරණේ විශේෂත්වයක් වන්නේ,
(1) සෑම තිරස් හා සිරස් ගල් පුවරුවක් ම කැටයම් කර තිබීම ය.
(2) තිරස් උඩලිපත් ජාතක කථා පුවත් ඇසුරෙන් කැටයම් කර තිබීම ය.
(3) සිරස් සතරැස් ගල්කණුවල පනේල, බුදුසිරිතේ සිද්ධීන් ඇසුරින් කැටයම් කර තිබීම ය.
(4) බුදුසිරිතේ සිද්ධීන්ට වඩා ඓතිහාසික පුවත්වලට මුල්තැන දීම ය.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** ලකුණු කැපීම : ..........................................................................................................

..........................................................................................................

**17.** පේකඩ : ..........................................................................................................

..........................................................................................................

**18.** කවන්ධ : ..........................................................................................................

..........................................................................................................


**19.** අර්ධ උන්නත : ..........................................................................................................

..........................................................................................................



**20.** ටෙම්පරා : ..........................................................................................................


..........................................................................................................

● අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D** සහ **E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  A

**22.**  (.........)  B

**23.**  (.........)  C

**24.**  (.........)  D

**25.**  (.........)  E

● අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**26.** ඉන්දීය අමරාවතී කලා ලක්ෂණ බලපා ඇති ................................ පිළිමය, අනුරපුර යුගයේ පිළිම අතුරින් ප්‍රධාන තැනක් ගනී.

**27.** මහබලිපුරම් හි 'ආකාශගංගාවරෝහණ' කැටයමෙහි ඇතැම් අංග, ඉසුරුමුණියේ ................................ කැටයම තුළින් සිහිපත් කරවයි.

**28.** නටරාජා පිළිරුවේ වම් පාදයෙන් පාගාගෙන සිටින වාමන රුවෙන් ................................ සංකේතවත් කරයි.

**29.** සිද්ධාර්ථ කුමරු නිරූපණය වෙතැයි සැලකෙන සුප්‍රකට අජන්තා සිතුවම .......................... නමින් හැඳින්වේ.

**30.** මරණින් මතු ආත්මය පිළිබඳව දැඩිව විශ්වාස කළ ................................ නරපතියෝ තම බල පරාක්‍රමය කලා නිර්මාණ තුළින් දැක්වීමට උත්සාහ දරා ඇත.

[හතරවැනි පිටුව බලන්න.


- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

**31.** **F** අක්ෂරයෙන් දැක්වෙන සිතුවමින් නිරූපණය කෙරෙන වැදගත් බෞද්ධාගමික පුවත කුමක් ද?

..........................................................................................................

**32.** **G** අක්ෂරයෙන් දැක්වෙන ශීර්ෂ කොටස සහිත හිටි පිළිමයෙන් නිරූපිත මුද්‍රාව කුමක් ද?

..........................................................................................................

**33.** **H** අක්ෂරයෙන් දැක්වෙන ගවරුව, හින්දු භක්තිකයන් අතර පූජනීයත්වයට පත්ව ඇත්තේ කුමක් නිසා ද?

..........................................................................................................

**34.** **I** අක්ෂරයෙන් දැක්වෙන මොනාලිසා නමින් හැඳින්වෙන මෙම උඩුකය සිතුවමින් නිරූපණය වෙතැයි සැලකෙන්නේ කවුරුන් ද?

..........................................................................................................

**35.** **J** අක්ෂරයෙන් දැක්වෙන 'පියෙටා' නමින් හැඳින්වෙන මූර්තිය දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

..........................................................................................................

- ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)

**36.** ස්ථානය : ..........................................................................................................

..........................................................................................................

**37.** තේමාව : ..........................................................................................................

..........................................................................................................

**38.** සම්ප්‍රදාය : ..........................................................................................................

..........................................................................................................

**39.** සංරචනය : ..........................................................................................................

..........................................................................................................

**40.** සමස්ත නිමාව : ..........................................................................................................

..........................................................................................................

* * *

92121

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 | I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
**General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)**

**චිත්‍ර I / சித்திரம் I / Art I**

- ප්‍රශ්න අංක **36** සිට **40** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සිතුවම භාවිත කරන්න.

  வினா இலக்கம் **36** தொடக்கம் **40** வரையிலான வினாக்களுக்கு விடையளிப்பதற்கு கீழே தரப்பட்டுள்ள உருவப்படத்தினை பயன்படுத்துக.

  Use the following painting to answer the questions from No. **36** to **40**.



* * *

92121

OL/2021(2022)/43-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]



**43 S II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)**
**General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)**

| | |
|---|---|
| චිත්‍ර II | පැය දෙකයි |
| சித்திரம் II | இரண்டு மணித்தியாலம் |
| Art II | *Two hours* |

**උපදෙස්** :

* ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන ලද සිතුවම් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
* ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

* ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර ඇඳීමේ කඩදාසිය භාවිත කරන්න.

* **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**
* ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම (ලකුණු 05)
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

**සැලකිය යුතුයි:**

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S III

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
# General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

**චිත්‍ර III**
**சித்திரம் III**
**Art III**

**පැය දෙකයි**
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්** :

- ✳ ඔබ ඇඳිය යුත්තේ **එක්** වර්ණවත් චිත්‍රයක් පමණි.
- ✳ ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ නියම කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- ✳ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට චිත්‍රය සම්පූර්ණයෙන් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ✳ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
- ✳ චිත්‍ර ඇඳීමේ විශේෂ කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් ප්‍රශ්නයක් පමණක්** තෝරාගන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. කතරගම පුදබිමේ ආගමික වතාවත්වල යෙදෙන බැතිමතුන් පිරිසක්
2. වනෝද්‍යානයකදී අලි රංචුවක් නරඹමින් සිටින සංචාරකයන්
3. රිලවකුගේ සෙල්ලම් පෙන්වන මිනිසකු හා නරඹන මිනිසුන් පිරිසක්
4. දූ දරුවන් සමග මුහුදු වෙරළේ සැඳෑ අසිරිය විඳින වැඩිහිටියෝ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. චීත්ත මුද්‍රණය සඳහා යොදා ගැනීමට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක අඟල් **9 × 9** ප්‍රමාණයේ කොටසක් අරලිය මල සහ අරලිය කොළවල හැඩතල යොදාගනිමින් නිර්මාණය කරන්න.
6. ආගමික සිද්ධස්ථානයක බිම ඇතිරීමට උචිත අඟල් **8 × 8** ප්‍රමාණයේ බිම් ගඩොලක් සඳහා සුදුසු වර්ණවත් මුලුතල මෝස්තරයක් සාම්ප්‍රදායික මෝස්තර ඇසුරෙන් නිර්මාණය කරන්න.
7. උත්සව අවස්ථාවක දී භාවිත කළ හැකි වර්ණවත් ධජ පතාකයක් උද්භිද සැරසිලි ඇසුරෙන් නිර්මාණය කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. 'Covid -19 පැරදවීමට පිළියම එන්නත්කරණයයි' යන මැයෙන් වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. නව නිෂ්පාදිත ළදරු සබන් කැටයක් ආවරණය කිරීම සඳහා වර්ණවත් දවටනයක් සැලසුම් කරන්න.
10. ආගමික චිත්‍ර කලාවට මෙහෙවරක් කළ කලාකරුවෙකුගේ නිර්මාණ දිවිය ඇගයෙන පොතකට සුදුසු පොත් පිටකවරයක් සැලසුම් කරන්න.

* * *